




සහන් වීරසේකර

# ජොලි සොමියට ආමන්ත්‍රණය නොකළ පපුවට තට්ටු කළ කපුගේ

## කලූමහත්තයා හෙවත් ඇල්ලමුල්ල කපුගේ ගුණදාස නම්වූ මනුසත්කම රජ කරවූ ගී රසවතා



බොරැල්ලේ බෝ ගස පසු කර බුද්දක වෝඩ් පෙදෙසට ගමන් කරනවා. මහා සෙනගක් පාර මැද, ඔල්වරසන් හඬ, සටන් පාඨ මුළු බොරැල්ල හන්දියම දෙවනත් කරයි. රතු සහෝදරයෝ වේදිකාව දෙස බලා සිටී, මා ද නිසොල්මන්ව පරණ දාස මුදලාලිගේ බිල්ඩිම අසල බිම හිර කට්ටය ලකුණු කලෙමි.

**මේ සඳේම සෙවනැල්ලේ අප හමු වූයේ**
**මේ සඳේම කඳුලැල්ලේ අප වෙන් වූයේ.....**

කපුගේ අයියා වේදිකාවේ උඩය. ඩුබායි සිට පැමිණි ගුවන් යානය කටුනායකට ගොඩ බසිනවා, ඊට පෙර පැමිණි ශ්‍රීලංකා ගුවන් සේවයේ ගුවන් යානයෙන් අපි ඩුබායි සිට පිටවෙන මොහොතේ කපුගේ අයියාද ප්‍රියන්ත ප්‍රනාන්දු සිටියේ යාබද පර්යන්ත බිමේ චෙක් (Czech) ගුවන් සේවයෙන් කොළඹ බලා පියාසර කිරීමටයි. නමුත් පෙරේදා මා දුටුවේ වින්දනය කලේ ඔහුගේ අවසන් ප්‍රසංගය බව මගේ පුංචි මොලේ හෝ කපුගේ අයියාගේ අත් පෙට්ටියවත් එහි සිටි නැපෝලියන්වත් සිහිනෙන්වත් හිතුවේ නැත

**විදුලි මිණි පහන් දැවී * බොළඳ ගී සිනා රැළී**
**නිලංකාර අඳුරේ සිරවී * සැඳෑ සාදයේ**
**කුරා කුහුඹු මිනිසා වෙමි මා ඔබේ මන්දිරේ**

කුරා කුහුඹු මිනිසා දැන් බොරැල්ලේ මානවයන් අමතයි. ඔහු 945 අගොස්තු 7 වනිදා මෙලොව එළිය දුටු බව වටේ ඉන්න තරුණ කොල්ලන් දන්නේ නැත. විදේශ සංගීත සංචාරයක් අවසන් කර කටුනායක ගුවන් තොටුපළෙන් මව්බිමට පැමිණි කපුගේ එහි දී සිදු වූ ඇදවැටීමක් නිසා හිස බිම වැදීමෙන් ජීවිත සංචාරයට නැවතුම් තිත තබන්නට සිදු වීම සමස්ත සංගීත රසික ප්‍රජාවගේ ද අවාසනාවක් වූ බව ගුවන් විදුලියෙන් ප්‍රකාශ වෙද්දී මගේ පුංචි මස්තිස්කය ඇද ගැට්ටේ වැදී රිදුම් දෙන්න විය. ඊයේ රාත්‍රිය මා සිත ගිගුම් දෙයි. අයියෝ කපුගේ යැයි කියැවිණි.

**මං හින්දා ඔබෙ නෙඟින් කඳුලක් හෙලන්නෙපා**
**මං හින්දා ඔබෙ හද තුල සුසුමක් නැගෙන්නෙපා**
**ගිවිසා ගනිමු අපි පෙම් යුවලක් සේ කිසිදා එක් නොවෙනා**

ඔහු වහා රෝහලට ගෙන යාමට අවශ්‍ය ගිලන් රථ සූදානම් නොකිරීම නිසා කපුගේගේ මරණයේ වගකීම ගුවන්තොටුපළ දැරිය යුතු වුවත් මේ වනතුරු ඊට එරෙහිව රතු සහෝදරවරු සොයා බැලුවේද හෝ නිසි ක්‍රියාමාර්ගයක් ගත්තේ ද යන්න කපුගේ වත් නොදනී.

1978 වසර කපුගේ තරුණයාට විශේෂ වසරකි. ඔහුගේ විවාහය සිදුවූයෙත්, ඔහුගේ රැකියාව අහිමි වූයේත් එම වසරේදීය. ප්‍රේමා නම් නව යොවුන් තරුණිය කපුගේට හිමිවී රැකියාව ඔහුට අහිමි වූයේ දෛවයේ අභියෝගාත්මක සරදමක් ලෙසිනි.

**දහසක් මල් මැද එකම මලයි පැතුවේ**
**එමල කිමද සරදම් කොට සැඟව ගියේ**
**දැනේ තවම මට මලේ සුවඳ පොද**
**තනිවේවි එක්ටැම්ගේ**

80 දශකයේ අතිශය ජනප්‍රිය වූ එක්ටැම්ගේ චිත්‍රපටයේ සංගීත නිර්මාණය භාර වුනේ දසනායක මහතාටය. හර්බට් රංජිත් අයියාගේ දැඩි පෙරැත්ත වුයේ කෙසේ හෝ දසනායකශූරීන් ලවා මෙම චිත්‍රපට පසුබිම් ගීතය ගායනා කරවා ගැනීමයි. නමුත් සරත් රසය දත් කපුගේ ගේ ගී හද එයට එක් කලේ එක්ටැම්ගේ චිත්‍රපටයට පමණක් නොව සිනමා පසුබිම් සංගීතයට ද වඩා ධනවාදී ආරෝපනයක් දෙමින්. මොහොතකට කාමරේ කවුළුවෙන් සුළං පොදක් බුද්දකගේ මුහුණ ස්පර්ශ කරනවා. පාලු හුදකලා සුලඟ පමනි උරුමේ කියා, සිතේ. හඬා වැටෙන සිත සදා සරණ මත තනි වේවි එක්ටැම් ගේ..මාව හුදෙකලා කල බව වැටුණු කඳුල කියයි.

අසාධාරණයට එරෙහිව දේශපාලකයන් සමඟ පවා ගැටෙමින් හිතට එකඟව ජීවත් වූ කපුගේ රසවතා ගුවන් විදුලියේ සේවය කරද්දී දඬුවම් මාරු නිතර ලැබුණි. වරක් රජරට සේවයට මාරු කර යැවීම, රජරට කුසලතා පිරි නවක පිරිසට ආශිර්වාදයක් විය. අනුරපුරේ නාලක අංජන කුමාර ඔහුගේ කම්පන ප්‍රසාංග පුරාවට වාදනයට පැමිණෙන්නේ කපුගේ නම් මනුසතාගේ ගුණවත්කම නිසාය. දිවුල්ගනේ ගායකයකු ලෙස මතු වූයේ ද කපුගේගේ අතහිත දීම නිසාය. හැබැයි මරණයේ සෙවනැලි සමග හුස්ම ගත් කාලයක් කපුගේ ට සහ දිවුලාට තිබිණි. පසු කාලයක දිවුලාගේ දේශපාලන කෙරුවාව දකින්නට ජීවත් නොවීමේ වාසනාව කපුගේට ද තිබුණි.

කරන්දෙණිය මහ විදුහලෙන් පසුව ගාල්ල නාගොඩ විදුහලේත්, ඉන්පසුව අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහලෙත් අධ්‍යාපනය හදාල කපුගේ 1959 වසරේ ගාලූ දිස්ත්‍රික්කයේ පාසල් අතර පැවැති ගායනා තරගයේ ප්‍රථම ස්ථානය හිමිකර ගත්තේය. තම පාසල් දිවියේ තවත් එක් කඩඉමක් පසුකරමින් 1963 වසරේදී ඔහු රජයේ ලලිත කලායතනයට (හේවුඩ්) ඇතුළුවිය. 1965 වසරේදී ඔහු ඉන්දියාව බලා පිටත් වන්නේ ලක්නව්හි භාත්කණ්ඩ් සංගීතය විද්‍යාලයේ වැඩිදුර සංගීත අධ්‍යාපනය ලබාගැනීමටයි. ඔහුගේ අධ්‍යාපන කටයුතු නිමා වූයේ 1969 වසරේදී සංගීත විශාරද උපාධිය හිමිකර ගිනිමිනි.

ඇල්ලල මුල්ල කපුගේ ගුණදාස ලෙසින් භාරතයට ගිය කලූමහත්තයා නැවත ශ්‍රී ලංකාවට පැමිණියේ ලවිශාරද ගුණදාස කපුගේල නමිනි. 1969 වසරේදීම ගුවන් විදුලි සංස්ථාවේ ශබ්ද පරිපාලකවරයකු ලෙස ඔහුට රැකියාවක් හිමිවන්නේ දෛවය ඔහුව ගුවන් විදුලිය වෙත සමීප කරවීමට තරම් කාරුණික වූ නිසාවෙනි. තාවකාලික පදනමට රැකියාවට පත් වූ ගුණදාස කපුගේ 1970 දී ස්ථිර විය. කාලයක් ගතවෙද්දි ගුවන් විදුලි නාට්‍ය ගණනාවක ශබ්ද පරිපාලක වෙන්න කපුගේට හැකි වෙනවා. සුගතපාල ද සිල්වා මහත්තයගෙ තුරඟ සන්නිය නාට්‍යයෙ සංගීත අධ්‍යක්ෂණය කරන්නෙත් අපේ සුන්දර කපුගේමයි. දේවාර් සූරියසේනගේ හමුවීමත් එක්ක කපුගේශබ්ද පරිපාලකයෙක් හැටියට ගුවන් විදුලියට බැඳෙනවා. සැපේදි විතරක් එකතු වෙලා කාලා බීලා විනෝද වෙන මිතුරන් අතරෙ දුකේදි ළඟම දැවටෙන කුළුණුබර මිතුරෙක් කපුගේට සමාපේදි මුණ ගැහෙනවා. ඒ තමයි ප්‍රභාත් මානවසිංහ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ පුත්‍ර රත්නය. කපුගේගෙ මුල්ම සරල ගී වැඩසටහනෙ ගීත රචනා වෙන්නෙත් ප්‍රභාත් අතින්. කපුගේගෙ ඔහු අනම්‍ය ස්වර රචනාවන්හි තනුව වෙනුවට ගීතයේ සාහිත්‍ය අර්ථය ගැයුවේය. ඔහු සිංහල ජන දිවියේ රිද්මය මැනවින් දැන සිටියාක් මෙන්ම ඒවා සිය නිර්මාණ වලට ද මුසු කළේය. ඔහුගේ ගීතවල වූ ප්‍රතිපත්ති සමාජයට සක්‍රියව දායක කළේය. වෙල්ලස්සේ ඉඩම් අරගලයේදී, සරසවි සිසු අරගල වල දී මෙන්ම පදවි ශ්‍රී පුර ජනතා අරගල වල දී ද ඔහු ජනතාව අත් හළේ නැත. කලාවට මනුෂ්‍යත්වය ප්‍රදානය කළ මිනිසා ඔහුය.ල රත්න ශ්‍රී උත්තමයා මතකය අවදි කරයි. කපුගේ කාපු බීපු විට කල සොමි දගකම් ඔහු බුද්දක සමග සිනාවකින් බෙදා ගනියි. ඒවා ලියන්න බෑ කියන්න විතරයි පුළුවන්. බෝතලේ අඩිය යටින් මට හිස් බවද රසයේ පිරිපුන් බව ද ඉක්කා ගසයි. අයියේ උඹ මිට වඩා උබට ආදරේ කලා නම් ..මගේ පපු කණ්ඩිය ඉකි බිදියි.

වේදනාව දෝතින්ම දරාගත්ත කපුගේ නොසෑහෙන්න ඇඬුව දවසක්, කොල්ලට අවුරුදු 10 දි උදාවෙනවා. පොඩි එකාගෙ හයිය වුණ පියා හදිසියේ මිය යනවා. එතැන ඉඳන් පුතාව රකින වගකීම සපුරාම පැටවෙන්නෙ අහිංසක අම්මගෙ කර මතට. පුංචි කපුගේ කරදඬු උස් මහත් වුණාට පස්සෙ ගැඹුරු ස්වර පිරිමැද්ද දවසක මේ ගීතය ගයනවා. මව්වත් කඳුළු කැට දහසක් වැගිරෙන හෝරාවක පුත්‍රයා ළයාන්විත ස්වර බැඳුමකින් ඒ කඳුළු පිසලනවා.

**දවසක් පැල නැති හේනේ * අකාල මහ වැහි වැස්සා * තුරුලේ හංගාගෙන මා ඔබ තෙමුණා, අම්මේ**

ආදරණීය බිරිඳ,ප්‍රේමා විතානගේ හමුවෙන්නෙත් ප්‍රභාත්ගෙ ගෙදර තිබුණ සාදයකදී.

1973 වසරේදී එකල සිංහල සේවා අධ්‍යක්ෂවරයෙකු වූ එච්. එම්. ගුණසේකර මහතාගේ විශේෂ අවසරය මත කපුගේට ගුවන් විදුලියේ ගීතයක් ගැයීමට ඉඩකඩ ලැබිණි. එහෙත් ඒවන විට කපුගේ අනුමත සරල ගායකයකු නොවේ. එනිසාම එම විශේෂ අවසරය මත එම ගීතය ගායනා කිරීමට ඔහුට සිදුවිය. ප්‍රියානන්ද විජේසුන්දර ලියූ ගී පද මාලාවට කපුගේ සරළව නිමැවූ තනුවට විශාරද සනත් නන්දසිරි නිර්මාණය කළ සංගීත රටාව සමග රසික හදවත් තදින් ඇද බැඳ ගත් එම ගීතය අදද අපට ආනන්දයක්ම ගෙන එනු ඇත.

**දෑස නිලූපුල් තෙමා * කඳුළු මුතු ලැල් සලා දෙතොල සුසුමින් පුරා * ඉකිබිඳ * හඬනු මල් මාලියේ**

ප්‍රියානන්ද අයියාද නිසි ඇගයීමට ලක්නොවීම ඔහු ලක්බිමේ ඉපිද අපිට අපුරු ගේ පද නිර්මාණ රාශියක් කරදීමේ කර්මය නිසාදෝ යැයි කියා මගේ යටි බඩ කකියා කියයි. ඔහුට නවසීලන්තයේ කිරි දෙනුන් හොදයි යැයි සිතන්නේ වර්තමාන තථ නාලිකා වෘෂභරාජයෝ වචන තලූ මරණ විටය.

**පායන තුරු හිටි පියවර සිටියා ඔබ අම්මේ**

කම්පන වේදිකාවේ කපුගේ නාලක දෙස බලා කදුළු පිසදයි. අසීමිත මාතෘ ප්‍රේමය කදුළු අතර බොඳවෙයි.
සුමනෝ * උලලේනෝ * අයියන්ඩියේ * සීතල සඳ එළියේ * දෙතොල නොකී දේ * බිම්බරක් සෙනග ගැවසුණු * උන්මාද සිතුවම් * මං මුලා වී * පිහිටක් නැති * දම් පාටින් ලා * සුබ ප්‍රාර්ථනාතව..වගේමතව.තරුමල් යායම * සබඳ අපි කඳු නොවෙමු * බිරිඳ මගේ ඔබ * සොඳුර නුඹ ලිහිණියක * නින්ද නැති රැයේ * බිංදු බිංදු තාරකා * දුක හාදු දෙන රැයේ * නාඹර ගොයමට ඇතුළු බොහෝ ජනප්‍රිය හරවත් ගී රස ගැන්වූයේ ඒ අසිරිමත් කටහඬ බව කළුවරේ සිටින උලලේනාද දනී.

එක අවස්ථාවකදි විශාල උපකාරයක් බලාපොරොත්තුවෙන් අපේ කපුගේ එවකට රජයේ ප්‍රබල ඇමතියෙක් මුණගැහෙනවා. කැමත්තෙන් හෝ අකමැත්තෙන් කපුගේ දැකපු ගමන් ආදරෙන් ගෞරවයෙන් කතාබහ කරන ඇමතියා අදාළ තැනට කතා කරලා "වැඩේ හරි" කියනවා. ටික දවසක් ගියත් කිසිම ප්‍රතිපලයක් නැති නිසා කපුගේ ආයෙත් ඇමතියා කරා යනවා. ඇමති එතකොටත් අදාළ ඉහළම තැනට කතා කරලා හොඳටම බනිනවා. කපුගේ ගෙ වැඩේ කරලා දෙන්න බැරි නම් තමන් ඇමතිකමෙනුත් ඉල්ලා අස්වෙනවා කියනවා. කාලයක් ගතවෙද්දි කපුගේට දැනගන්න ලැබෙන්නෙ පුදුම ආරංචියක්. බලද්දි ඒ ඇමති ගෙදර ඉඳන් කතා කරන්නෙ විසන්ධි කෙරුව දුරකතනයකින්ලූ. ඔන්න ඔය වගේ බාල වැඩ කෙරුව මිනිස්සු හිටිය රටක, ඉතිරි අහිංසක හිත් ආදර ස්වරයෙන් මුසපත් කෙරුව කපුගේ, ඇත්ත හිත් පතුලෙ කවදාවත් විසන්ධි නොවන චරිතයක්


ඒ දුක්ඛ දෝමනස්සයන් සිය හඬ තුළ ප්‍රකම්පනය කොට ගනඳුරෙහි සැඟව ඇති ශාන්තිය හා නින්ද අපට දී විඳවන සහෘදයා ඔහුය. වේදනාවේ සදාකාලික කටහඬ ඔහුය. ඔබ නික්ම ගොසින් වසර 15 ක් පමණ යයි සිතන්නට බැරිය. අරගලයට මිනිස්කමින් ද ආදරයෙන් ද උරගල තබන මිනිසා ඔහුය. මිය නොගිය, කිසිදා නික්ම නොගිය මිනිසා ඔහුය.

අපි කඳු නෙමෙයි, එකම ගඟකට වැටෙන සුනිල දිය දහරක් විතරමයි ඕක ඉක්මනට එවපන්, ජගත් අයියා කෑ මොර දෙයි. කපුගේ අයියේ මට ඇඬෙනවා, උඹ ඇදෙනවා, මම රැවක් හොයනවා, කවුදෝ එනවා.

**උහුලන්න බෑ..... සබඳ අපි කඳු නොවෙමු.**






# කවුළුවක් මං පියන්පත් නැති

## ලක්ෂ්මන් කොඩිතුවක්කු

ෆාස්ට් පබ්ලිෂිං

මේ යුගයේ සිංහල නවකතාවේ පිබිදීමක් දක්නට ඇතැයි අපට සිතෙන්නේ විවිධ තේමා යටතේ ලියැවුණ කතා රැසක් කියවන්නට ලැබීම නිසා ය. විවිධාකාර සාහිත්‍ය තරග අරමුණු කරගෙන හෝ බිහිවන මේ නවකතා ගොන්න අතර වඩාත් කැපී පෙනෙන නවකතාවක් ලෙස ලක්ෂ්මන් කොඩිතුවක්කු ගේ කවුළුවක් මං පියන්පත් නැති නවකතාව හඳුන්වා දිය හැකි ය.

කෙටිකතාකරුවකු ලෙස නිර්මාණකරණයට පිවිසෙන ලක්ෂ්මන් ඒ ක්ෂෙත්‍රයේ දිග ගමනක් ගිය නිර්මාණකරුවෙකි. පසුගිය වසරේ ගොඩගේ සාහිත්‍ය සම්මානයට පවා නිර්දේශ වන තරමට ඒ ගමන සාර්ථක එකක් විය. ලක්ෂ්මන් නවකතාකරුවකු ලෙස ප්‍රථම වතාවට අපට හමුවන්නේ කවුළුවක් මං පියන්පත් නැති කෘතියෙනි.

ශ්‍රී ලාංකේය දේශපාලනයේ එක් අඳුරු යුගයකින් ඇරඹෙන නවකතාවේ ප්‍රධාන චරිතය පියරතන හිමි වෙයි. ඒ යුගයේ දේශපාලකයන් අතින් පහර කත පියරතන හිමි උපැවිදි වී පියරත්න ලෙස සමාජයට බසින තැන සිට ඔහු ධනවතකු වන තෙක් ගලා යන කතාව තුළ අපට හමුවන්නේ නුහුරු ලිංගික සම්බන්ධතාවක් නිසා දිගින් දිගට ඔහු මුහුණ දෙමින් සිටින සිදුවීම් දාමය ය. මේ කතාව කීමේදී ඒ ඒ යුගයේ සමාජ දේශපාලන පරිසරය අප හමුවේ මවන්නට ලක්ෂ්මන් සමත් වෙයි. කෙටිකතාකරුවකු ලෙස ඔහු ලත් පන්නරය මේ කතාව ගොඩ නැගීමේදී මනාව ඉවහල් වී ඇති බව අපට පෙනී යයි.


"කොහොමත් පණ්ඩිතරත්න මහත්තයා කොලොන්නාවෙ සීට් එක දිනනවා. විපක්ෂයෙන් දාලා තියෙන්නේ අමු රස්තියාදුකාරයෙක්නෙ. උන්ට පුලුවන්ද අපේ ඇමතිතුමා පරද්දන්න?"

ඒ සුවිශේෂී මැතිවරණයේදී පණ්ඩිතරත්නලා පැරදී අමු රස්තියාදුකාරයන් බලයට පත් වූ ආකාරයත් ඒ රස්තියාදුකාරයන් ශ්‍රී ලංකාවේ සමස්ථ සමාජ දේහයම විකෘති කළ අන්දමත් කතාවේ පසුබිමින් අපට කියවාගත හැකිවෙයි.

බලයට පත් රස්තියාදුකාරයන් පණ්ඩිතරන්ත මහත්තයාට සහයෝගය දැක්වූ ගමේ පන්සලේ හාමුදුරුවන්ට එළව එළවා පහරදී පන්නාගත් ආකාරයත් පන්සලේ සිටි පියරතන පොඩි හාමුදුරුවන් ගමට පලා ගොස් උපැවිදි වන ආකාරයත් ඉන් අනතුරුව ගිහි ජීවිතයේදී පියරතන මුහුණ දෙන හැල හැප්පීම් ආදියත් පාඨකයා හමුවේ මවන්නට ලක්ෂ්මන් ගන්නා උත්සාහය සාර්ථක ය.

"වෙඩි හඬින් හා කළු දුම් රොටු වළාවන් වලින් වැසුණු ජූලි කලබලය ජාතිවාදී කලබලයකට පෙරළාගත් පිරිස අතරට එක් වූ විජේනායක මහත්තයා තමන්ගේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් එය ප්‍රයෝජනයට ගත්තේ ය" 129 පිට

විජේනායකලා ජාතිවාදය අවුලා



තමන්ගේ ගමන් මග එසේ සකස් කර ගනිද්දී ඔහුගේ බිරිඳ පියරත්න සමග එක්වන්නේ තමන්ට දරුවකු සාදා ගැනීම සඳහා පමණකි. මේ සියල්ල වටහා නොගැනීම තුළ අතර මං වන පියරත්න ඉතා පැටලිලි සහගත ලෙස තමන්ගේ ඉදිරිය ගොඩ නගා ගන්නා ආකාරය අපට පෙනී යයි.

"මට පුතා දැක්කම පියරත්න මතක් වෙනවා.. කොච්චර අමතක කරන්න හැදුවත් වතුර යට ඔබාගෙන ඉන්න රබර් බෝලයක් වගේ ආපහු උඩට මතුවෙනවා.. පුතා වෙනුවෙන් මං තමුසෙට ඕනෙම උදව්වක් කරන්නං පියරත්න" 189 පිට

කතාවේ උත්ප්‍රාසය උත්කර්ශයට නැංවෙන අවස්ථාව වන්නේ සුලෝචනා මැතිනියගේ දේහය පියරත්නගේ මල් ශාලාවේ දී පියරත්නගේම දෑතින් සකස් කිරීම ය. මේ වන විට ආර්ථික අතින් වඩාත් සව්මත් තැනක සිටින පියරත්න සුලෝචනාලා ගේ පිරිහීම දෙස නොසැලී බලා සිටියි.

"මේ මා ඇහිඳපු කතාවක් නොවේ. සොයාගත් හෝ සොරාගත් කතාවක්ද නොවේ. මා දුටු මට ඇසුණු මා ජීවත් වූ පරිසරයෙන් උකහාගත් සත්‍යයත් කල්පිතයත් අතර දොලනය වෙමින් ගලා යන අපේම මිනිසුන්ගේ කතාවකි" පෙර වදනේදී ලක්ෂ්මන් අපට කියන මේ කාරණයට මනා සාධාරණයක් නිර්මාණය තුළින් අපට දැකිය හැකිය.

ජගත් ජේ එදිරිසිංහ